# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1833/27 - 2013 ඔක්තෝබර් මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2013.10.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී.24/51(vii).

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත**

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 21, 22, 23, 24, සහ 24 අ වගන්ති සමග කියවිය යුතු, එකී පනතේ 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

කුමාර වෙල්ගම,
ප්‍රවාහන අමාත්‍ය.

2013 සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

නියෝගය

2011 මැයි මස 4 වැනි දින අංක 1704/09 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් අවසන් වරට සංශෝධනය කරනු ලැබූ 1952 පෙබරවාරි මස 27 වන දින අංක 10,360 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, සහ කලින් කළ සංශෝධනය කරනු ලැබූ 1951 මෝටර් වාහන (විවිධ) නියෝග එහි සතරවන උපලේඛනය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

**"සතරවන උපලේඛනය**

(9 වන නියෝගය)

*ගාස්තු*

| | *විස්තරය* | *ගාස්තුව* |
|---|---|---|
| 1. | සියලු මෝටර් කෝච්, සියලු මෝටර් ලොරි, මෝටර් කාර්, ද්විත්ව කාර්ය වාහන, විශේෂ කාර්ය වාහන හෝ ඉඩම් වාහන සඳහා තැපැල් ගාස්තුව ඇතුළුව ඉදිරිපස සහ පිටුපස අංක තහඩු කට්ටලය සහ ස්ටිකරය. | රු.3300.00 |
| 2. | මෝටර් ට්‍රයිසිකල් සහ මෝටර් ට්‍රයිසිකල් වෑන් සඳහා තැපැල් ගාස්තු ඇතුළු ඉදිරිපස සහ පිටුපස අංක තහඩු සහ ස්ටිකරය. | රු.2800.00 |
| 3. | අත් ට්‍රැක්ටර් සහ මෝටර් සයිකල් සඳහා තැපැල් ගාස්තුව ඇතුළු ඉදිරිපස සහ පිටුපස අංක තහඩු කට්ටලය සහ ස්ටිකරය. | රු.2400.00 |


1A - PG 01806 — 650 (2013/10)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**"සතරවන උපලේඛනය** (සම්බන්ධිතයි)

(9 වන නියෝගය)

*ගාස්තු*

| *විස්තරය* | *ගාස්තුව* |
|---|---|
| 4. වෙළෙන්දන්, අළුත්වැඩියා කරන්නන්, නිෂ්පාදනය කරන්නන්, එකලස් කරන්නන්, පෙර සැකසුමකින් තනන්නන්, අලුතින් නිර්මාණය කරන්නන්, අනුවර්තනය කරන්නන්, විකර්ණය කරන්නන් හෝ නිර්මාණ වෙනස් කරන අධිකාරය යටතේ නිකුත් කරන ලද ඉදිරිපස සහ පිටුපස අංක තහඩු කට්ටලය. | රු.4000.00 |
| 5. මි.මී. 520 x මි.මී. 110 ප්‍රමාණයෙන් යුක්ත වූ සුදු හෝ කහ පැහැති ප්‍රතිපරාවර්තන පසුබිම් සහිත අංක තහඩු. | රු.1500.00 |
| 6. මි.මී. 280 x මි.මී. 180 ප්‍රමාණයෙන් යුක්ත වූ කහ පැහැති ප්‍රතිපරාවර්තන පසුබිමක් සහිත අංක තහඩු. | රු.1500.00 |
| 7. මි.මී. 280 x මි.මී. 200 ප්‍රමාණයෙන් යුක්ත වූ කහ පැහැති ප්‍රතිපරාවර්තන පසුබිමක් සහිත අංක තහඩු. | රු.1500.00 |
| 8. මි.මී. 300 x මි.මී. 80 ප්‍රමාණයෙන් යුක්ත වූ සුදු පැහැති ප්‍රතිපරාවර්තන පසුබිමක් සහිත අංක තහඩු. | රු.1000.00 |
| 9. මි.මී. 240 x මි.මී. 130 ප්‍රමාණයෙන් යුක්ත වූ සුදු පැහැති හෝ කහ පැහැති ප්‍රතිපරාවර්තන පසුබිමක් සහිත අංක තහඩු. | රු.1000.00 |
| 10. මි.මී. 520 x මි.මී. 110 හෝ මි.මී. 280 x මි.මී. 180 ප්‍රමාණයෙන් යුක්ත වූ රතු පැහැති ප්‍රතිපරාවර්තන පසුබිමක් සහිත අංක තහඩු. | රු.2000.00 |
| 11. හඳුනා ගැනීමේ අංක තහඩු ස්ටිකරය | රු.250.00 |
| 12. මෝටර් සයිකල් සහ මෝටර් ට්‍රයිසිකල් සඳහා හැර සියලු මෝටර් වාහන සඳහා දැනට නිකුත් කරනු ලබන අංක වලින් ඉදිරියට අංක 10,000 දක්වා විශේෂ අංක වෙන් කිරීම. | රු.50,000.00 |
| 13. මෝටර් සයිකල් සහ මෝටර් ට්‍රයිසිකල් සඳහා පමණක් දැනට නිකුත් කරනු ලබන අංක වලින් ඉදිරියට අංක 10,000 දක්වා විශේෂ අංක වෙන් කිරීම. | රු.6000.00 |
| 14. මෝටර් සයිකල් සහ මෝටර් ට්‍රයිසිකල් සඳහා හැර සියලු මෝටර් වාහන සඳහා දැනට නිකුත් කරනු ලබන අංක වලින් ඉදිරියට අංක 20,000 දක්වා විශේෂ අංක වෙන් කිරීම. | රු.60,000.00 |
| 15. මෝටර් සයිකල් සහ මෝටර් ට්‍රයිසිකල් සඳහා පමණක් දැනට නිකුත් කරනු ලබන අංක වලින් ඉදිරියට අංක 20,000 දක්වා විශේෂ අංක වෙන් කිරීම. | රු.8000.00 |
| 16. මෝටර් සයිකල් සහ මෝටර් ට්‍රයිසිකල් සඳහා හැර සියලු මෝටර් වාහන සඳහා දැනට නිකුත් කරනු ලබන අංක වලින් ඉදිරියට අංක 30,000 දක්වා විශේෂ අංක වෙන් කිරීම. | රු.70,000.00 |
| 17. මෝටර් සයිකල් මෝටර් ට්‍රයිසිකල් සඳහා පමණක් දැනට නිකුත් කරනු ලබන අංක වලින් ඉදිරියට අංක 30,000 දක්වා විශේෂ අංක වෙන් කිරීම. | රු.10,000.00" |

11 - 282

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.